# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2460/49 – 2025 නොවැම්බර් මස 01 වැනි සෙනසුරාදා – 2025.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39(අ)(1) වැනි වගන්තිය යටතේ නියමය

2012 දෙසැම්බර් මස 19 වැනි දින අංක 1789/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2012 අංක 315 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/11.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය:
WGSWD&EIP/ACQ/MH/01.

2025 සැප්තැම්බර් මස 26 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 526බී, ගංගොඩවිල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගංගොඩවිල (මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2018/473 හා 2021.02.18 දිනැති අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර ‘AS’ – වරි. අංක 10/13 (කොටසක්) පරණ කැස්බෑව පාර – ප්‍රමාණය: හෙක්. 0.0018**

උතුරට: කැබලි අක්ෂර AU, මු.පිකො 9591 හි කැබලි අංක 64, මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර AT, AR සහ AQ; නැගෙනහිරට: කැබලි අක්ෂර AQ, පරණ කැස්බෑව පාරේ වරි. අංක 10/13A සහ 10/13 දරන ඉඩම්; දකුණට: පරණ කැස්බෑව පාරේ වරි. අංක 10/13 දරන ඉඩම, අගල සහ කැබලි අක්ෂර AV; බටහිරට: කැබලි අක්ෂර AV, AW සහ AU, මු.පිකො 9591 හි කැබලි අංක 64 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර AT.

EOG 11 – 0014



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39(අ)(1) වැනි වගන්තිය යටතේ නියමය

2016 නොවැම්බර් මස 21 වැනි දින අංක 1994/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2016 අංක 284 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2016/HW/281.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/2/3/10/267.
2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 328A, තල්ගස්මොටේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තල්ගස්මොටේ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 510610 හි කලාප අංක 03 පත්‍ර අංක 04 හා 2022.04.22 දිනැති කැඩැස්තර සිතියමට අනුව (ගම්/අත්/2016/343 හා 2016.05.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ G 117, G 119 කැබලි) පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 652 – කෝන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0169**

උතුරට: කැබලි අංක 312 සහ 646; නැගෙනහිරට: කැබලි අංක 647, 651, 653, 651 සහ 654; දකුණට: කැබලි අංක 651, 653, 654 සහ 658; බටහිරට: කැබලි අංක 658 සහ 312.

02. **කැබලි අංක 654 – කෝන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0019**

උතුරට: කැබලි අංක 652 සහ 651; නැගෙනහිරට: කැබලි අංක 653; දකුණට: කැබලි අංක 653, 657 සහ 658; බටහිරට: කැබලි අංක 658 සහ 652.

EOG 11 – 0015

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.